# පොහොර පිළිබඳව ඔබ දත යුතු කරුණු

**සීමාසහිත ජනතා පොහොර ව්‍යවසාය යනු කුමක්ද?**

ජන පොහොර ව්‍යවසාය ආයතනය උසස්ම ගුණාත්මයෙන් යුත් අමුද්‍රව්‍ය ආනයනය කර යන්ත්‍රානුසාරයෙන් පොහොර මිශ්‍රණ නිෂ්පාදනය කර ජන පොහොර නමින් වෙළෙඳපොළට ඉදිරිපත් කරන රාජ්‍ය ආයතනයකි. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දීප ව්‍යාප්ත අලෙවි මධ්‍යස්ථාන සහිත මෙම ආයතනය ගොවි ජනතාවට අවශ්‍ය සියලුම පොහොර වර්ග නිපදවනු ලබයි.

**නිෂ්පාදනය කරනු ලබන පොහොර වර්ග**

සියලුම භෝග සඳහා පොහොර මිශ්‍රණ සකස් කර ජන පොහොර නමින් වෙළඳපොළට ඉදිරිපත් කර ඇත. තේ, රබර්, පොල්, වී, එළවළු, අර්තාපල්, ලූනු, මල්, බුලත්, පලතුරු, කෙසෙල්, මිරිස්, කරාබු, කරදමුංගු, කුරුඳු, දුම්කොළ, කෝපි, කොකෝවා, ගම්මිරිස් යන භෝග සඳහා නිර්දේශිත පොහොර ඕනෑම ප්‍රමාණයක් ලබා ගත හැකිය.

**නිර්දේශිත පොහොර මිශ්‍රණ යනු කුමක්ද?**

භෝග වගාවකින් ලැබෙන අස්වැන්නේ ස්වරූපය අවශ්‍යතාව මත එකිනෙකට බොහෝ සෙයින්, වෙනස් වේ. එනම්, තේ වගාවේදී දළු, පත්‍ර ද රබර් වගාවේ ක්ෂීරයද, වී වගාවේදී ධාන්‍යද, අස්වැන්න ලෙස ලබා ගනී. එම නිසා භෝග වගාවකින් උසස් ප්‍රතිඵල ලබාගැනීම සඳහා අස්වැන්නේ ස්වරූපය හා ශාක වර්ධන විලාශය අනුව පර්යේෂණ මධ්‍යස්ථානවල කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලවලින් නිර්දේශිත පොහොර මිශ්‍රණ එක් එක් භෝග වර්ගය සඳහා වෙන වෙනම හඳුන්වා දී ඇත. වෙනත් අයුරකින් කිවහොත්, භෝගයකින් ඉවත්වන පෝෂක පදාර්ථ ප්‍රමාණය පසට ආපසු ලැබෙන පරිදි සකස් කරන ලද මිශ්‍රණ නිර්දේශිත මිශ්‍රණ වේ. මෙම නිර්දේශිත මිශ්‍රණවල නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් ප්‍රමාණයන් භෝග වර්ගය අනුව වෙනස් වේ. එහෙයින් නිර්දේශිත පොහොර අදාළ භෝගය සඳහා යෙදීම අතිශයින් වැදගත් වේ.

"ජන පොහොර" වශයෙන් ගොවි ජනතාව වෙත සපයනු ලබන්නේ මෙවැනි නිර්දේශිත පොහොර මිශ්‍රණ පමණකි.

**පොහොර මිශ්‍රණවල ගුණාත්මක භාවය උසස් වන්නේ කෙසේද?**

කෘෂිකාර්මික කටයුතුවලදී භාවිතා කරනු ලබන පොහොර මිශ්‍රණවල ප්‍රධාන වශයෙන් ඇත්තේ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් යන පෝෂක පදාර්ථ වේ. භෝග වර්ධනයට අත්‍යාවශ්‍ය මෙම පෝෂක ලබා ගනුයේ විවිධ රටවලින් ආනයනය කරනු ලබන යූරියා, ඇමෝනියම් සල්ෆේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්, වැනි සංයෝගවලිනි. එබැවින් පොහොර මිශ්‍රණයක ගුණාත්මකභාවය රඳා පවතිනුයේ එය සෑදීම සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල ගුණාත්මය මත වේ. "ජන පොහොර" මිශ්‍රණ සඳහා සෑම විටම භාවිතා කරනුයේ නියමිත පෝෂක පදාර්ථ ප්‍රමාණයන් අන්තර්ගත උසස්ම පොහොර වර්ග වේ. ජන පොහොර වෙතින් ආනයනය කරනු ලබන සෑම පොහොර වර්ගයක්ම නියමිත පෝෂක පදාර්ථ ප්‍රමාණයන් ඇති බව සනාථ කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන හා ප්‍රමිති ආයතනය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**"ජන පොහොර" මෙතරම් ජනප්‍රිය වීමට හේතු කවරේද?**

1. සාධාරණ මිල.
2. නියමිත ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අව්‍යාජ පොහොරක් බැවින් ඉතා උසස් ඵලදාවක් ලබාදීමේ හැකියාව.
3. ලාභයට වඩා සේවාව අගය කෙරෙන රජයේ වාණිජ්‍ය ආයතනයක් වශයෙන් "ජන පොහොර" කීර්ති නාමයක් ලබා තිබීම.

**ජන පොහොර ලබා ගත හැක්කේ කෙසේද?**

ජන පොහොර දීප ව්‍යාප්ත අප අලෙවිසැල් මගින් සහ බලය ලත් වෙළඳ නියෝජිතයන්ගෙන් ලබා ගත හැක. නොඑසේනම් කොළඹ මාදම්පිටිය පොහොර මිශ්‍රණාගාරයෙන් සහ කඩුගන්නාව පොහොර මිශ්‍රණාගාරයෙන් පොහොර ලබා ගත හැක.

| **ජන පොහොර අලෙවිසැල්** | | **ලිපිනය** | **දුරකථන අංක :** |
|---|---|---|---|
| අනුරාධපුරය | - | දුම්රිය බඩු ගබඩාව, අනුරාධපුරය. | 025-2095 |
| කැකිරාව | - | දුම්රිය ගබඩාව, කැකිරාව. | 025-4295 |
| මහියංගනය | - | පාලංහන්දිය, වේරගන්තොට මහියංගනය. | 055-7147 |
| මාතලේ | - | දුම්රිය ගබඩාව, මාතලේ. | 066-3202 |
| කඩුගන්නාව | - | 11, අලගල්ල පාර, කඩුගන්නාව. | 08-71436 |
| අලව්ව | - | දුම්රිය ගබඩාව, අලව්ව. | 037-43113 |
| කුරුණෑගල | - | දුම්රිය ගබඩාව, කුරුණෑගල. | 037-23817 |
| මාදම්පෙ | - | දුම්රිය ගබඩාව, මාදම්පෙ. | 01-665721 |
| හික්කඩුව | - | දුම්රිය ගබඩාව, හික්කඩුව. | 09-77846 |
| මාතර | - | දුම්රිය ගබඩාව, මාතර | 041-22794 |

**ප්‍රධාන කාර්යාලය සහ ගබඩාව :**

ලිපිනය :19, ධවලසිංහාරාම මාවත, කොළඹ 15.

**දුරකථන අංක :** 522693, 522193, 522819